2023 පෙබරවාරි

## MMCA ශ්‍රී ලංකාහි ප්‍රමෝදා වීරසේකර බැංගලෝර්හි කලා හා ඡායාරූප කෞතුකාගාරයේදී කතාකරයි.

ඉන්දියාවේ බැංගලෝර්හි කලා හා ඡායාරූප කෞතුගාරය (MAP) විසින් සංවිධානයකරන 'න්‍යායයෙන් ඔබ්බට: සමකාලීන ස්ත්‍රීවාදී පරිච සිතියම්ගතකිරීම' (Beyond Theory: Mapping Feminist Practices in the Contemporary) නමැති සම්මේලනයේදී, ශ්‍රී ලංකා නූතන හා සමකාලීන කලා කෞතුකාගාරයේ (MMCA ශ්‍රී ලංකා) අධ්‍යාපන හා මහජන වැඩසටහන් සහය අභිරක්ෂක ප්‍රමෝදා වීරසේකර අදහස් දක්වනු ඇත. මෙම සම්මේලනය 2023 මාර්තු 24–25 දිනවල පැවැත්වෙන අතර, මාර්තු 24 පැවැත්වෙන දකුණු ආසියාවේ අභිරක්ෂක පරිච පිළිබඳ සාකච්ඡා මඩුල්ලකට සහභාගීවීමට වීරසේකරට ආරාධනා ලැබී ඇත.

මෙම සම්මේලනය පැවැත්වෙන්නේ "දෘශ්‍ය/අදෘශ්‍ය: MAP එකතුව හරහා කලාව තුළ කාන්තා නියෝජනය" (Visible/Invisible: Representation of Women in Art through the MAP collection) යන තේමාව යටතේ පැවැත්වෙන ප්‍රදර්ශනයකට සමගාමීව ය. සම්මේලනයේ අවධානය දෘශ්‍ය කලා තුළ ස්ත්‍රීවාදී පරිච කෙරෙහි යොමුවන අතර, කෞතුකාගාරවල මහජන වැඩසටහන් සඳහා ස්ත්‍රීවාදී ප්‍රවේශයක් ගැනීම පිළිබඳව වීරසේකර කතාකරනු ඇත.

"මෙම සම්මේලනයේදී, දකුණු ආසියානු කලා ප්‍රජාව තුළ නැගී එන වෘත්තිකයන් මඩුල්ලක කොටස්කරුවෙකුවීමට ලැබීම ගැන මම සතුටුවෙනවා. අප බොහෝ විට කෞතුකාගාරයක මහජන වැඩසටහන් දකින්නේ හුදෙක් යම් වැඩසටහනක් ක්‍රියාත්මකකිරීමක් ලෙස වුවත්, එහි ඉන් ඔබ්බට ගිය කාර්යයක්වන සහභාගීවන්නන් අතර සංවාද දිරිමත්කිරීමත් සිදුවෙනවා. මේ සඳහා ප්‍රදර්ශනයේ තබා ඇති කලාකෘති මෙන් ම අපේක්ෂිත ප්‍රේක්ෂකයින් පිළිබඳව කැපවී නිර්මාණාත්මකව හිතන්න ඕනේ. MAP විසින් ස්ත්‍රීවාදී කාචයකින් කලා සංවිධානවල වැඩසටහන්කරණය පිළිබඳව සිතීමට වැදගත් පියවරක් ගෙන ඇතැයි මම හිතනවා" යැයි වීරසේකර සඳහන්කළා ය.

MMCA ශ්‍රී ලංකාහි ගැලරි කතා, වැඩමුළු, සහ විශේෂ අභිවහනවලට සහභාගීවන්නන් අතර, එදිනෙදා ස්ත්‍රීවාදී දිවියක් ගතකිරීම හා බැඳුණු තේමා

Groundfloor, Crescat Boulevard
89 Galle Road
Colombo 03

Registered Address:
117 Sir Chittampalam A. Gardiner Mawatha
Colombo 02
Sri Lanka

info@mmca-srilanka.org
www.mmca-srilanka.org

පිළිබඳව වීරසේකර ආරම්භකර ඇති සංවාද ඇගේ කතාවේ විෂයවනු ඇත. 2022 කාන්තා දිනයට සමගාමීව MMCA ශ්‍රී ලංකා පැවැත්වූ මහජන වැඩසටහන්වලදී දික්කසාද සහ පවුල් නීතිය, ඔසප්වීම හා බැඳි අපකීර්තිය, සහ කාන්තා ශ්‍රමය ආර්ථිකයට දායකවන ආකාරය ආදී කරුණු පිළිබඳව ඇය ඉදිරියට ගෙනා සංවාද මේ අතර ප්‍රධානවෙයි. MMCA ශ්‍රී ලංකාහි 'මුණගැසීම්' ප්‍රදර්ශනයේ තෙවන වටමාරුවේ සංදර්ශනයකර ඇති, ජෝර්ජ් කීට් (1901–1993), නෙළුන් හරස්ගම (b. 1959), සහ ජනනි කුරේ (b. 1974) යන අයගේ කලාකෘතිවලට අදාළ ගැලරි කතාවලදී ගත් ස්ත්‍රීවාදී ප්‍රවේශය ද වීරසේකර ස්පර්ශකරනු ඇත.

කෞතුකාගාර වෘත්තිකයෙකු ලෙස ඇගේ වෘත්තීය දිවියට මෙම සම්මේලනයෙන් ඇති වැදගත්කම පිළිබඳව වීරසේකර අදහස් දැක්වූයේ මෙසේ ය: “2019 සිට MMCA ශ්‍රී ලංකාහි අධ්‍යාපන හා මහජන වැඩසටහන් පිළිබඳ මගේ වැඩ කටයුතු හරහා, මහජනයා දෘශ්‍ය කලාව හා සම්බන්ධකිරීමට විශාල දායකත්වයක් ලබාදීමට මට හැකිවෙලා තියෙනවා. අභිරක්ෂකයෙකු ලෙස මාගේ කාර්යභාරය පිළිබඳවත්, ස්ත්‍රීවාදී චින්තනයෙන් සාරවත්වූ පොදු අත්දැකීම් සංකල්පගතකිරීම සහ ක්‍රියාවට නැංවීම පිළිබඳවත් ප්‍රත්‍යවේක්ෂණය කිරීමට මම මෙය අවස්ථාවක් කරගන්නවා.”

වීරසේකර සමග ඉන්දියාවේ චෙන්නායි පාදකකරගත් සුජනා කල්කිනි සහ ඉන්දියාව පාදකකරගත් වීරංගනකුමාරි සොලංකි මේ මඩුල්ලේ කතාකරනු ඇත.